ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2262/24 - 2022 ජනවාරි මස 11 වැනි අඟහරුවාදා - 2022.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.- බී. 21/ 78 (ix)

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

137 වන වගන්තිය යටතේ වූ රීති

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70ඇ සහ 70ඈ යන වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 70ආ වගන්තිය යටතේ පත්කරන ලද නිශ්චිත බලධරයා විසින් 137 වන වගන්තිය යටතේ සාදන ලද රීති.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
නිශ්චිත බලධරයා.

2022 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දීය.

රීති

2018 අගෝස්තු මස 30 වන දින අංක 2086/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් අවසන් වරට සංශෝධිත 2013 අගෝස්තු මස 22 වැනි දින අංක 1824/21 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2013 අංක 1 දරන නිශ්චිත බලධරයාගේ (උපාධි

1A - PG 5699 – 510 (2022/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන්, ආයතන පිළිගැනීමට අදාළ බලතල) රීති පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) " IV වන කොටස " යන වචනය සහ ඉලක්කමට ඉක්බිතිවම දැක්වෙන ශීර්ෂය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

" සැකසුම් ගාස්තු

(අ) සමාලෝචන ගාස්තු "

(2) 35 වන රීතිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

" 35. මේ රීතිවල III වන උපලේඛනයේ සඳහන් පරිදි ආයතනික සමාලෝචන සහ විෂය සමාලෝචන, සැකසුම් ගාස්තුවකට යටත් විය යුතුය.";

(3) 37 වන රීතියෙහි " එම ස්ථානය ඇගයීම සඳහා ආයතනික සමාලෝචනයට අයකරනු ලබන සැකසුම් ගාස්තුවෙන් සියයට විස්සක (20%) අමතර ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය " යන වචන වෙනුවට " එම එක් එක් ස්ථානය ඇගයීම සඳහා ආයතනික සමාලෝචනයට අයකරනු ලබන සැකසුම් ගාස්තුවෙන් සියයට විස්සක (20%) අමතර ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්.

(4) 37 වන රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"(ආ) ප්‍රති - සමාලෝචන ගාස්තු

38. ආයතනික ප්‍රති-සමාලෝචන සහ විෂය ප්‍රති - සමාලෝචන, පළමු ආයතනික සමාලෝචන සහ විෂය සමාලෝචන සිදු කරන ලද දින සිට වසර පහකට (5) පසු සහ ඉන්පසු සෑම වසර පහක් අවසානයේ දී අනුගාමීව පැවැත්විය යුතුය. ප්‍රති - සමාලෝචන සඳහා වන සැකසුම් ගාස්තු, IV වන උපලේඛනයෙහි දක්වා ඇත.

39. (1) මේ රීතිය ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී යම් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් -

(අ) ආයතනික සමාලෝචන සහ විෂය සමාලෝචන සිදුකරන ලද දින සිට වසර පහක් (5) හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති අවස්ථාවක, මේ රීති ක්‍රියාත්මක වන දින සිට ලිත් මාස හයක් (6) ඇතුළත;

(ආ) ආයතනික සමාලෝචන සහ විෂය සමාලෝචන සිදුකරන ලද දින සිට වසර පහක් (5) සම්පූර්ණ කර නොමැති අවස්ථාවක, එකී වසර පහ (5) සම්පූර්ණ වන එහෙත් ලිත් මාස දෙකක් පසුනොවන දින සිට හැකිතාක් ඉක්මනින්,

එම ආයතනය විසින් I වන සහ II වන උපලේඛනයන් හි දී ඇති මාර්ගෝපදේශවල දක්වා ඇති ආකාරයට එකී ආයතනය ප්‍රති - සමාලෝචනය කිරීම සඳහා වන මාර්ගෝපදේශවල දක්වා ඇති තොරතුරු ඇතුළත් වන I වන කොටස හෝ II වන කොටස හෝ එම කොටස් දෙකම සමන්විත වන ඉල්ලීමක් නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(2) අදාළ ඉල්ලීම ප්‍රති-සමාලෝචන සඳහා ඉදිරිපත් කරන විට, කලින් අනුමත කරන ලද සමාලෝචන ඉල්ලීමෙහි ඇති යම් සංශෝධනයක් හෝ පරස්පර යයි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනය විසින් පැහැදිලිව දක්වා නිශ්චිතව ලකුණු කළ යුතුය. IV වන උපලේඛනයෙහි දක්වා ඇති අදාළ සැකසුම් ගාස්තු ගෙවනු ලැබූ බවට සාක්ෂි, ඉල්ලීමට අමුණනු ලැබිය යුතුය.

40. අවස්ථාවෝචිත පරිදි, 39(1)(අ) හෝ (ආ) රීතියේ සඳහන් නිශ්චිත කාලසීමාව අතරතුර උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් විසින් ආයතනික ප්‍රති - සමාලෝචනය සහ විෂය ප්‍රති - සමාලෝචනය සඳහා වන මාර්ගෝපදේශවල දක්වා ඇති නියමයන්ට අනුකූල නොවන අවස්ථාවක, එකී ඉල්ලීම ප්‍රති-සමාලෝචනයට සඳහා ඉදිරිපත් කිරීමට නියමිත දිනට පසුව මාස තුනක වැඩිකර කාලසීමාවක් සඳහා නිශ්චිත බලධරයා විසින් අවසර දෙනු ලැබිය යුතු අතර V වන උපලේඛනයේ සඳහන් ගාස්තුවට අමතරව IV වන උපලේඛනයේ දක්වා ඇති මුදල් ප්‍රමාණයෙන් සියයට පනහක (50%) ප්‍රමාද ගාස්තුවක් ප්‍රමාණානුකූල පදනම මත අයකරනු ලැබිය යුතුය.

41. උපාධි ප්‍රදානය කිරීමේ ආයතනය විසින් ආයතනික ප්‍රති - සමාලෝචන සහ විෂය ප්‍රති-සමාලෝචන සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක, නිශ්චිත බලධරයා විසින්, එම අනනුකූලතාව පිළිබඳ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එහි පිටපතක් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනය වෙත යැවිය යුතුය ".

(5) 41 වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"(ඇ) උපාධි පාඨමාලාව සංශෝධනය කිරීම සඳහා අදාළ වන ගාස්තු

42. යම් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් විසින් අධ්‍යයන පටිපාටියට සිදුකළ යුතු යම් සංශෝධන, යම් උපාධි පාඨමාලා සඳහා වන ඇතුළත් කරගැනීමේ සුදුසුකම්, හෝ යම් අධ්‍යයන වැඩසටහනක් උසස් කිරීම හෝ ප්‍රමිතිකරණය කිරීම සඳහා වන සංශෝධන යෝජනා කරනු ලබන අවස්ථාවක, එම ආයතනය විසින් අදාළ තොරතුරු ඇතුළත් වන ඉල්ලීමක් නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. V වන උපලේඛනයෙහි දක්වා ඇති සැකසුම් ගාස්තු ගෙවනු ලැබූ බවට සාක්ෂි, ඉල්ලීමට අමුණනු ලැබිය යුතුය ".

(6) 38 වන රීතිය, 43 වන රීතිය ලෙස නැවත අංකනය කිරීමෙන්.

(7) III වන උපලේඛනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කිරීමෙන් :-

[38 වන රීතිය]

## *IV වන උපලේඛනය*

(අ) වසර පහක (5) කාලසීමාවක් සඳහා ආයතනික ප්‍රති-සමාලෝචනයට අදාළ වන සැකසුම් ගාස්තු රු. 1,200,000.00 විය යුතුය.

(ආ) වසර පහක (5) කාලසීමාවක් සඳහා විෂය ප්‍රති-සමාලෝචනයට අදාළ වන සැකසුම් ගාස්තු පහත පරිදි වේ :-

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| ශ්‍රී ලංකා සුදුසුකම් සැලැස්වීමේ (එස්. එල්. කිව්. එෆ්) මට්ටම් | සුදුසුකම් වර්ගය | අයකළ යුතු මුදල් ප්‍රමාණය (රුපියල්) |
| එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 12 | ආචාර්ය උපාධිය (පී. එච්.ඩී) | 750,000.00 |
| එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 11<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 10<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 9 | දර්ශනපති උපාධිය හා ශාස්ත්‍රපති උපාධිය | 600,000.00 |
| එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 08<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 07<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 06<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 05 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>පශ්චාත් උපාධි සහතික පත්‍ර<br>ගෞරව ප්‍රථම උපාධිය<br>ප්‍රථම උපාධිය | 500,000.00 |

[42 වන රීතිය]

## *V වන උපලේඛනය*

මේ වන විටත් පිළිගත් උපාධි පාඨමාලාව සඳහා සිදුකරන යම් සංශෝධන (අධ්‍යයන පටිපාටි ප්‍රතිශෝධනය ඇතුළත් කර ගැනීමේ සුදුසුකම) සඳහා වන ප්‍රති - සැකසුම් ගාස්තු පහත පරිදි වේ:-

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| ශ්‍රී ලංකා සුදුසුකම් සැලැස්වීමේ (එස්. එල්. කිව්. එෆ්) මට්ටම | සුදුසුකම් වර්ගය | අයකළ යුතු මුදල් ප්‍රමාණය (රුපියල්) |
| එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 12 | ආචාර්ය උපාධිය (පී. එච්. ඩී) | 375,000.00 |
| එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 11<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 10<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 9 | දර්ශනපති උපාධිය හා ශාස්ත්‍රපති උපාධිය | 300,000.00 |
| එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 8<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 7<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 6<br>එස්. එල්. කිව්. එෆ්. මට්ටම් අංක 5 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>පශ්චාත් උපාධි සහතික පත්‍ර<br>ගෞරව ප්‍රථම උපාධිය<br>ප්‍රථම උපාධිය | 250,000.00 |

EOG 01-0121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.